# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1798/25 - 2013 පෙබරවාරි මස 20 වැනි බදාදා - 2013.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි II වන උපලේඛනයේ I වන තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූද, එම උපලේඛනයේ II වන තීරුවේ තදානුරූපීව මායිම් සහ ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූද, ප්‍රදේශය හා I වන උපලේඛනයෙහි දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ එක් එක් ප්‍රදේශය එම වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයන් ප්‍රකාශ කරමි.

ඒ අනුව දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති I වන උපලේඛනයේ සඳහන් ප්‍රදේශය ද ඇතුළුව II වන උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රදේශයද, දෙහිඕවිට නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ සීමාවන් තුලට ඇතුලත් විය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

I වන උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | ගැසට් නිවේදන අංක : 1045/6 | - | 1998.09.15 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇත. |
| 02. | ගැසට් නිවේදන අංක : 709/8 | - | 1992.04.09 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇත. |
| 03. | ගැසට් නිවේදන අංක : 1409/22 | - | 2005.09.09 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇත. |

1A - PG 001568 — 395 (2013/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## II වන උපලේඛනය

*I වන තීරුව*

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නාවූ මෙහි II වන තීරුවෙන් විස්තර වන ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 117බී නාපාවල, අංක 118 ඇපලපිටිය, අංක 115 උඩුවිල, අංක 118බී පහල තල්දූව, අංක 118ඒ ඉහල තල්දූව, අංක 116 ඩී දෙබෑගම, අංක 116බී අටුලුගම, අංක 116එෆ් අටුලුගම්වෙල, අංක 116 සී කනන්ගම, අංක 115ඒ කහනාවිට, අංක 119බී දෙහිඕවිට, අංක 119 අල්ගොඩ, අංක 118ඩී තිඹිරිපොල, අංක 124 සී ගලබලනකන්ද, අංක 124 මානියන්ගම, අංක 125 මාදොල, අංක 125ඒ වෙලන්ගල්ල, අංක 124බී විහාරකන්ද, අංක 124ඒ බෝමළුව, අංක 123 බටංගල, අංක 122ඒ රන්ගේගම, අංක 116 මාගම්මන යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලට අයත් මුළු ප්‍රදේශය.

*II වන තීරුව*

උතුරට ; නාපාවල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 117බී නාපාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට ගිණිකොන දෙසට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ අඳිනු ලබන රේඛාව අංක 118සී උඩුවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද ;

එතැන් සිට අංක 118සී උඩුවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 117ඒ කැලෑගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක් ද ; එතැන් සිට කැලෑගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම් රේඛාව ඔස්සේ ඊසාන දෙසට අඳිනු ලබන රේඛාව අංක 117ඒ කැලෑගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට අංක 117ඒ කැලෑගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම් රේඛාව ඔස්සේ උතුරට හා වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 117 දයිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද ; එතැන්සිට අංක 117 දයිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ඊසාන දෙසට අඳිනු ලබන රේඛාව අංක 117 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද; එතැන්සිට, අංක 117 දයිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 116ඊ එළුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක්ද; එතැන් සිට, අංක 116ඊ එළුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම රේඛාව ඔස්සේ ඊසාන දෙසට අඳිනු ලබන රේඛාව අංක 116ඊ එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද ;

නැගෙනහිරට ; අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 116 ඊ එළුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 116 මාගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන තෙක්ද ; එතැන්සිට අංක 116 මාගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 116 සී කනන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද ; එතැන් සිට, අංක 116 සී කනන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට, නිරිත දෙසට සහ නැවතත් ගිනිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 116 සී කනන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද ; එතැන්සිට අංක 116 සී කනන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 115 ඒ කහනාවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 115 ඒ කහනාවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට හා ගිණිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 115 ඒ එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 115ඒ එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට අඳිනු ලබන රේඛාව අංක 119බී

II වන උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරුව* | *II වන තීරුව* |
| --- | --- |
| | දෙහිඕවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට,අංක 119බී දෙහිඕවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 119 අල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 119 අල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට සහ ගිණිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 119 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 119 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ වයඹ දෙසට, නිරිත දෙසට සහ නැවතත් වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 123 බටංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 123 බටංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 120 ඒ හිඟුරලකන්ද බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 120ඒ හිඟුරලකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ වයඹ දෙසට සහ නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 120ඒ එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම තෙක්ද ; එතැන්සිට, අංක 120ඒ එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගිණිකොන දෙසට සහ නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 122සී පොකුණුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු සහ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 122සී පොකුණුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ නිරිත දෙසට සහ ගිණිකොන දෙසට අඳිනු ලබන රේඛාව අංක 121ඩී අම්බලන්පිටිය ග්‍රාම නිලධාරි, කොට්ඨාසයේ උතුරු සහ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 121ඩී අම්බලන්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ නිරිත දෙසට අඳිනු ලබන රේඛාව 122බී මැදගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම් හමුවන ලක්ෂ්‍යයද දක්වාද ; එතැන් සිට අංක 122බී මැදගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නිරිත දෙසට, ගිනිකොන දෙසට සහ නැවතත් නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 122බී එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද ;<br><br>දකුණට ; අංක 112බී මැදගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු සහ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දකුණු මායිම වේ.<br><br>බටහිරට ; අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 122 පනාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 122ඒ රංගේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු සහ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 122ඒ රංගේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ වයඹ දෙසට, නිරිත දෙසට සහ නැවතත් වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 125 ඒ වෙලන්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු සහ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 125 ඒ වෙලන්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ වයඹ දෙසට |

II වන උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| | අඳිනු ලබන රේඛාව අංක 125 මාදොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 125 මාදොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට, දකුණු දෙසට සහ නැවතත් නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 125 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 125 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 125 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක්ද ; එතැන්සිට, අංක 125 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට, වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 125 එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 125 එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම් රේඛාව ඔස්සේ ඊසාන දෙසට, ගිනිකොන දෙසට නැවතත් ඊසාන දෙසට අඳිනු ලබන රේඛාව අංක 124 මානියන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 124 මානියන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට සහ වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 118බී පහලතල්දූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු සහ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 118බී පහල තල්දූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ වයඹ දෙසට, ඊසාන දෙසට සහ නැවතත් වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 118 ඇපලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර සහ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට, අංක 118 ඇපලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ වයඹ දෙසට, නිරිත දෙසට සහ නැවතත් වයඹ දෙසට අඳිනු ලබන රේඛාව අංක 118 ඇපලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම් හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 118 එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට උතුරු දෙසට හා නැවතත් ඊසාන දෙසට අඳිනු ලබන රේඛාව අංක 117බී නාපාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද ; එතැන්සිට, අංක 117 බී නාපාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට, උතුරු දෙසට හා නැවතත් ඊසාන දෙසට හා නිරිත දෙසට අඳිනු ලබන රේඛාව අංක 117බී නාපාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය හමුවන තෙක්ද වේ. |

03 - 419

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.